# නුවරඑළිය මහා නගර සභාව

## ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන, ශිල්පීය තනතුරුවල පුරප්පාඩු පිරවීම-2018

නුවරඑළිය මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත 3.1 වගුවේ සඳහන් තනතුරුවල iii පන්තියට බඳවා ගැනීම සඳහා නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 02. බඳවා ගැනීමේ සුදුසුකම් (iii පන්තියට බඳවා ගැනීම)

### 2.1 බඳවා ගැනීමේ පොදු කොන්දේසි

- සියළුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික විය යුතුය.
- නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.(අයදුම්කරුවන්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් මෙම මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවකු බවට සනාථ කරන ලියවිලි සම්මුඛ පරීක්ෂණයේදී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතුය.)

  නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත්‍ර සලකා බැලීමෙන් අනතුරුව අදාළ තනතුර සඳහා පළාත් පාලන බල ප්‍රදේශයේ අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු සංඛ්‍යාවට සමානව තෝරා ගැනීමට සුදුසුකම් සැපිරූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොවූ අවස්ථාවලදී පමණක් නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි යාබද පළාත් පාලන ආයතන බලප්‍රදේශ අයදුම්කරුවන්ගේ අයදුම්පත් ද සලකා බලනු ලැබේ. (සෑම විටම නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ අයදුම්පත්‍ර සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන අතර, මෙම වගන්තිය හේතුවෙන් වෙනත් පළාත් පාලන ආයතන බල ප්‍රදේශ අයදුම්කරුවකුහට අනිවාර්යයෙන් අවස්ථාව ලබාදිය යුතු බවට සලකා ක්‍රියා කිරීමට අයිතිවාසිකමක් මින් නොලැබේ.)
- අයදුම්කරුවන්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නො අඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනටමත් සේවයේ නියුතු අය සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් මෙම තනතුර සඳහා පත්වීම් ලදහොත් නව තනතුරේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවනු ලබන බව සැලකිය යුතුය.)
- සියලුම අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
- සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමෙන් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

## 03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
- වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු අතර, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය)
- **වැටුප් පරිමාණය**

  PL 1 - 3/2016 - රු: 24,250-10X250-10X270-10X300-12X330-36,410/-

  PL 3 - 3/2016 - රු: 25,790-10X270-10X300-10X330-12X350-38,990/-
- iii පන්තියේ නියමිත වැටුප් පරිමාණයේ හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

### 3.1 තනතුර හා අධ්‍යාපන සුදුසුකම් (වගුවේ දක්වා ඇත)

| අනු අංකය | තනතුරු නාමය හා සේවා කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව | වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | **PL – 1 කාණ්ඩය** | | | |
| 01 | පුස්තකාල සහායක (Library Assistant) PL 1-3/2016 | 01 | පුස්තකාල කටයුතු සම්බන්ධ රජයේ පිළිගත් ආයතනයකින් පුහුණුවක් ලබා ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කෙරේ. | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙන් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක්වරකදී සමත්ව තිබිය යුතුය. නමුත්, 2015.09.22 දිනැති ව්‍යවස්ථා සංශෝධන අංක 9.2, 2.1 අනුව සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා පමණක් පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පටිපාටියේ සඳහන් සුදුසුකම් 05 ශ්‍රේණිය සමත්වීම දක්වා අඩුකර බඳවා ගැනීමට සලකා බලනු ලැබේ. |
| 02. | ජල මීටර් කියවීම්කරු (Water Meter Reader) | 01 | අදාළ නොවේ. | |
| 03. | ජල කර්මාන්ත කම්කරු (Water Works Laborers) | 08 | අදාළ නොවේ. | |
| 04. | සෞඛ්‍ය කම්කරු (Health Laborers) PL1-3/2016 | 14 | අදාළ නොවේ. | |
| 05. | උද්‍යාන කම්කරු (Park Laborers) | 22 | අදාළ නොවේ. | |
| 06. | ආයුර්වේද කම්කරු (Aurvedic Laborers) | 01 | අදාළ නොවේ. | |
| 07. | තක්සේරු පරීක්ෂක Valuation Inspector | 01 | අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කෙරේ. | |
| | **PL – 3 කාණ්ඩය** | | | |
| 08 | රියදුරු | 06 | තාරබර හොන්ඩර 34 ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32 ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් ලබා තිබීම. (මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද "ඒ, සී හා සී 1" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "බී" පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වෙනි මට්ටමේ (NVQ-4) පුහුණු සහතිකය. යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය. | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |
| 09 | බර වාහන ක්‍රියාකරු | 01 | | |

© THE ASSOCIATED NEWSPAPERS

ඉහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමේදී නුවරඑළිය මහා නගර සභාවේ පවතින සේවක අවශ්‍යතාවය සලකා ඒ අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

## 04. බඳවා ගැනීමේ ක්‍රමය

ඉදිරිපත් කර ඇති අයදුම්පත් අතරින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමුකර වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී පහත අංශ කෙරෙහි අවධානය යොමු කරනු ලබයි.

| | නිර්ණායක |
|---|---|
| 01 | සන්නිවේදන හැකියාව /පෞරුෂය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |
| 02 | අධ්‍යාපන සුදුසුකම් / අ.පො.ස. සා.පෙළ සමත්වී තිබීම |
| 03 | වෘත්තීය සුදුසුකම් |
| 04 | තනතුරට ලබා ඇති පළපුරුද්ද (උපරිම වසර 5ක් සඳහා සලකා බලනු ලැබේ) |
| 05 | වෙනත් අදාළ සුදුසුකම්<br>නුවරඑළිය මහා නගර සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. |

- රියදුරු, බර වාහන ක්‍රියාකරු තනතුරු සඳහා බඳවා ගැනීමට පෙර ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර එම පරීක්ෂණයෙන් සුදුස්සන්

තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

**05. අයදුම්කළ යුතු ආකාරය**

- එක් අයදුම්කරුවකුට අයදුම් කළ හැක්කේ එක් තනතුරක් සඳහා පමණි.
- නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පහත පරිදි A4 ප්‍රමාණයේ කොළයක දෙපැත්තම භාවිතා කර සකස් කරන ලද අයදුම්පතක් 2018.12.18 වැනි දිනට හෝ ඊට පෙර, නාගරික කොමසාරිස්, මහා නගර සභාව, නුවරඑළිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. (අයදුම්පත පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය)
- අයදුම්පත් බහා එවන කවරයේ වම්පස කෙළවරේ "**නුවරඑළිය නගර සභාවේ තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම**" යන්න සඳහන් කළ යුතුය.
- අසම්පූර්ණ හෝ නියමිත දින පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.
- බඳවා ගනු ලබන අයගේ සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය නුවරඑළිය මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය නාගරික කොමසාරිස් සතුය.
- අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

  I. උප්පැන්න සහතිකය
  II. අදාළ අධ්‍යාපන සහතික
  III. මෑතකදී ලබාගත් ග්‍රාම නිලධාරී සහතිකය (පදිංචි සහතිකය)
  IV. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
  V. වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික
  VI. සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය
  VII. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපත

**2018 නොවැම්බර් මස 29 වැනි දින**
**නුවරඑළිය මහා නගර සභාවේදීය.**

**එස්.පී.කේ. බෝධිමාන්න**
**නුවරඑළිය නාගරික කොමසාරිස්.**

# ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාතේ නුවරඑළිය මහා නගර සභාවේ........................................................................ තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය**

01. I. මුලකුරු සමග නම : ..............................
    II. මුලකුරු වලින් හැඳින්වෙන නම : ..............................

02 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය: .............................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..............................
   ග්‍රාම නිලධාරී කොට්ඨාසය : ..............................

03 ස්ථිර පදිංචි ලිපිනය : ..............................

04 ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

05 ස්ත්‍රී/පුරුෂ භාවය : .............................. විවාහක අවිවාහක බව : ..............................

06 ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු : .............................. මාස : ..............................දින : ..............................

OF CEYLON LTD. ALL RIGHTS RESERVED

07 නුවරඑළිය මහා නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය අවුරුදු : .............................. මාස : .............................. දින : ..............................

08 ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද, ලියාපදිංචියෙන්ද, යන වග : ..............................

09. අධ්‍යාපන සුදුසුකම් (සමත් විභාග පිළිබඳ විස්තර)
   සමත් වූ වසර / ශ්‍රේණිය : ..............................
   අ.පො.ස සා පෙළ විභාගය : ..............................
   විභාග අංකය : .............................. විභාග වර්ෂය හා මාසය : ..............................

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

   සමත් වූ වසර/ ශ්‍රේණිය : ..............................
   අ.පො.ස (උ/පෙළ) විභාගය : ..............................
   විභාග අංකය : .............................. විභාග වර්ෂය හා මාසය : ..............................

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |

10. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය) : ..............................

11. සේවා පළපුරුද්ද : ..............................
    I. දැනට සේවය කරන ආයතනය : ..............................
    II. දැනට දරන තනතුර : ..............................
    III. එම තනතුරට පත් වූ දිනය : ..............................
    IV ඊට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර : ..............................

12. ඔබ කවරදක හෝ චෝදනා මත උසාවියකින් වරදකරු කර තිබේද : ..............................
    එසේ නම් ඒ පිළිබඳ විස්තර : ..............................

13. **අයදුම්කරුගේ සහතිකය.**

මෙම ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් /තොරතුරක් සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා තනතුරට නුසුදුස්සකු වන බවත්, මා තනතුරකට පත් කිරීමෙන් පසු තොරතුරු වැරදි හෝ අසත්‍ය බව අනාවරණය වුවහොත් එයින් මා තනතුරට නුසුදුසස්කු වන බවත්, කිසිම වන්දියක් නොමැතිව තනතුරෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මා දනිමි.

අයදුම්කරුගේ අත්සන : ..............................

දිනය : ..............................

**දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා වන ආයතන ප්‍රධානියාගේ සහතිකය.**

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන.............................. මහතා/මහත්මිය/මෙනවිය.............................. දින සිට මෙම කාර්යාලයේ .............................. වශයෙන් සේවය කරනු ලබයි. ඉහත තනතුරට තෝරා පත්කර ගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැක. /නොහැක. ඔහු / ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

..............................

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන**
**(නිල මුද්‍රාව යොදන්න)**

නම :- ..............................
පදවි නාමය :- ..............................
දෙපාර්තමේන්තුව / ආයතනය :- ..............................
දිනය :- ..............................